**වලල්ලාවිට ප්‍රාදේශීය සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**
**--------------------**

**1.** මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**--------------------------------**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබද විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 30 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 සැප්තැම්බර් 23 දින ද සභාපතිවරයාට යවා ඇත**.**

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------ | ---------------------- |
| (i) | තොග වටිනාකම ලෙස භෞතික තොගය ගිණුම්ගත කිරීම වෙනුවට රු.4,727,197 ක් වූ පොත් අගය ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයට අදාලව 2019 වර්ෂයේදී ගෙවීම් කරන ලද රු.159,356 ක වියදම් සඳහා 2018 වර්ෂයේදී ණයහිමි වෙන් කිරීම් සිදු කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සභාව සතු ස්ථාවර තැන්පත් සඳහා සමාලෝචිත වර්ෂයට අදාල රු.241,525 ක් වු පොලිය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | පරිත්‍යාග ලෙස ලැබි තිබූ රු.2,000,000 ක් වටිනා කසල කම්පැක්ටරය රු.2,594,999 ක් ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| (v) සමාලෝචිත වර්ෂයට අදාල කර්මාන්ත ආධාර රු.2,161,130 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| (vi) සමාලෝචිත වර්ෂය අවසානයට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ගෙවිය යුතු රු.2,967,535 ක මුදල සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| (vii) රු.1,790,650 ක් වූ වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | නිවැරදි කිරිමට කටයුතු කරමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

-----------------------

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන් දිමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.31,219,253 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාළ ශේෂයන් හා ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.2,145,341 ක වෙනසක් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරිමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදි නිවැරදි කිරිමට කටයුතු කරමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

---------------------------------------------------------

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| යාවත්කාලීන කරන ලද තැන්පත් ලේඛන හා උපලේඛන නොමැති වීම නිසා එකතුව රු.16,321,132 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | උප ලේඛන හා රිසිට්පත් ඉදිරිපත් කලයුතු අතර තැන්පත් ලේඛනය යාවත්කාලීන කළ යුතුවේ. | තැන්පත් ලේඛන යාවත්කාලීන කර ඇති අතර උපලේඛන සකස් කර ඇත. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| - | රු. | | | |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය | | දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ ඇතුළත පිහිටියා වූ නිශ්චල දේපල වල වරිපනම් බදු සඳහා නව හඳුනාගැනීමක් සිදු කර නොතිබුණි. | වරිපනම් බදු සඳහා නව හඳුනාගැනීම් සිදු කල යුතුවේ. | තව දුරටත් නව වරිපනම් කලාප ඇති කිරිමට කටයුතු කරමි. |
| (ආ) 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන ගැසට් නිවේදනය | - | සමීක්ෂණයක් මගින් පරිසර බලපත්‍ර ලබාගත යුතු ආයතන හඳුනාගෙන නොතිබුණි. | ගැසට් නිවේදනය ප්‍රකාරව පරිසර බලපත්‍ර ලබාගත යුතු ආයතන හඳුනාගත යුතුවේ. | පරිසර බලපත්‍ර ලබාගත යුතු ස්ථාන පිළිබඳ සොයා බලා ලිපි යොමු කර ඇති අතර මේ වනවිට එකී කාර්යය විධිමත්ව සිදු කරමි. |

2 මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,716,475 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,441,905 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,785,796 | 2,171,699 | 3,039,076 | 1,799,048 | 2,758,628 | 2,763,598 | 2,980,112 | 1,965,705 |
| (ii) | කුලී | 262,800 | 262,800 | 262,800 | - | 265,200 | 262,800 | 262,800 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 90,000 | 320,679 | 320,679 | - | 90,000 | 247,240 | 247,240 | - |
| (iv) | වෙනත් ආදායම් | 63,513,839 | - | 67,872,012 | - | 62,076,002 | - | 69,376,907 | - |

2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ වසර 05 ඉක්ම වූ හිඟ වරිපනම් බදු ශේෂය රු.1,240,591 ක් වූ අතර ඉත්තැපාන උප කාර්යාලයට අදාල මුළු හිඟ වරිපනම් බදු ශේෂය රු.1,036,322 ක් විය.එකී හිඟ ශේෂයෙන් වසර 05 ඉක්ම වූ හිඟ වරිපනම් බදු ශේෂය රු.908,687 ක් හෙවත් සියයට 88 ක් විය. | හිඟ වරිපනම් ආදායම කඩිනමින් අයකර ගත යුතුවේ. | ක්ෂේත්‍රයේ ගොස් අය කිරිමට කටයුතු කරන බවත් මේ වනවිට හිඟ යෙන් වැඩි මුදලක් අයකර ඇත. |

2.2.3 මස්කඩ කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2012 වර්ෂයේ සිට පැවත එන රු.56,637 ක් වූ හිඟ මස් කඩ කුලී ආදායමක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී අයකර ගත යුතු වේ. | හිඟ මස් වෙළඳසැල් ආදායම බදුකරුගේ අයකර ගැනිම සඳහා ඔහු පදිංචි ස්ථානය සොයා ගත නොහැකි වී ඇති බැවින් ඒ පිළිබඳව සහකාර පළාත් පාලන කොමසාරිස් වෙත දැනුම් දි පරික්ෂණයක් සිදු කරමින් පවති. |

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.6,333,533 ක් හා මුද්දර ගාස්තු රු.2,369,135 ක් විය. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | 2018 වර්ෂයේ උසාවි දඩ මුදල් අයකර ගැනිම සඳහා පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට යවා ඇති බවත් 2019 වර්ෂයේ මුද්දර ගාස්තු ලැබිම රු.6,977,145 ක් බව දන්වා ඇත. |

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) අතුරු ව්‍යවස්ථා | | |
| ප්‍රාදේශිය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 16 ක් ඉටු කිරිම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් සභාව විසින් ප්‍රධාන කාරණා 08 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුවේ. | දැනට අතුරු ව්‍යවස්ථා 08 ක් පනවා ගෙන ඇති අතර අවශ්‍යතාවය පරිදි ඉදිරියේදි අතුරු ව්‍යවස්ථා පනවා ගැනිමට කටයුතු කරමි. |
| (ආ) ක්‍රියාකාරි සැලැස්ම | | |
| (i) වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම මගින් සභාවේ මාර්ග 06 ක මාර්ග ගැටළු හඳුනාගැනීමට අපේක්ෂා කර තිබූ නමුත් වර්ෂය තුල එකී ගැටළු හඳුනාගෙන ඒවා විසඳීමට කටයුතු කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුව වර්ෂයේ ක්‍රියාකාරකම් සැලසුම් කර ක්‍රියාත්මක කල යුතුවේ. | 2019 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම මගින් අඩුපාඩු නිවැරදි කරන බව හා 2018 වර්ෂයේ දී ප්‍රාදේශිය ලේකම් කාර්යාල මගින් සිදු කරන ලද ව්‍යාපෘති සිදු නොකළ බව දන්වමි. |
| (ii) වාර්ෂික අයවැය ලේඛනය මගින් වැය කිරීමට අපේක්ෂා කර තිබූ රු.66,626,770 ක මුදල වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මෙහි අන්තර්ගත ආකාරය පිළිබඳ මූල්‍යමය | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුව වර්ෂයේ ක්‍රියාකාරකම් සැලසුම් කර ක්‍රියාත්මක කල යුතුවේ. | 2019 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම මගින් අඩුපාඩු නිවැරදි කරන අතර 2018 වර්ෂයේදි ප්‍රාදේශිය ලේකම් කාර්යාල |

| | | |
|---|---|---|
| සැලැස්මක් ඉදිරිපත් කර නොතිබුණි. | | මගින් සිදු කරන ලද ව්‍යාපෘති සිදු නොකරන ලදි. |

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------

| | | |
|---|---|---|
| ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් 2017 හා 2018 යන වර්ෂවල පිළිවෙලින් රු.1,021,447 ක් හා රු.5,847,778 ක වියදමක් දරා තිබූ අතර එම වියදම 2017 වර්ෂයට සාපේක්ෂව සියයට 472 ක වැඩිවීමකි. මෙකී වියදම අවම කර ගැනීම සඳහා සුදුසු අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කර නොතිබුණි. | සුදුසු ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ සටහනක් වර්ෂය පුරා ක්‍රියාත්මක කල යුතුවේ. | කොම්පෝස්ට් නිෂ්පාදනය කරන යන්ත්‍ර හා හලර් යන්ත්‍රය අළුත්වැඩියා කිරිමට සිදු වීම හා කසල එකතු කිරීමේ කටයුතු ව්‍යාප්ත කිරිම නිසා ඒ සඳහා අතිරේක වැය බරක් දැරීමට සිදු වී ඇත. |

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------

| | | |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් වාර්ෂික අයවැය ලේඛනය හා ක්‍රියාකාරි සැලැස්ම මගින් තිරසර සංවර්ධන අරමුණු සඳහා නව ගෝලීය දර්ශක තුලින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන කෙටි කාලීන හා දිගු කාලීන සැලසුම් ඉදිරිපත් කර නොතිබුණි. | තිරසර සංවර්ධන වැඩ සටහන පිළිබඳ දැනුවත් වී ඒ සඳහා සලැස්මක් සකස් කර ක්‍රියාත්මක කල යුතුවේ. | මේ වන විට ඒ සඳහා අවශ්‍ය සැලසුම් සකස් කර ඊට ප්‍රමුඛතාවය ලබා දී ඇත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

| විගණන නිරීක්ෂණය<br>---------------------- | නිර්දේශය<br>------------ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම<br>---------------------- |
|---|---|---|
| ආයතන 27 කට අදාලව කල් ඉකුත් වී තිබූ පරිසර බලපත්‍ර නැවත අළුත් කිරිමට කටයුතු කර නොතිබූ අතර හඳුනාගන්නා ලද පරිසර බලපත්‍ර නිකුත් කලයුතු ආයතන 08 කට අදාල බලපත්‍ර නිකුත් කිරිමට ද කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත් වූ පරිසර බලපත්‍ර අළුත් කිරිමට හා නව පරිසර බලපත්‍ර නිකුත් කිරිමට කටයුතු කළ යුතුවේ. | බලපත්‍ර ලබාගත යුතු ආයතන සඳහා බලපත්‍ර ලබා දීමට කටයුතු කරමින් සිටිමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) තෘතියික මට්ටමේ තනතුරු 01 ක, ද්විතියික මට්ටමේ තනතුරු 08 ක හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 11 ක පුරප්පාඩු පැවති අතර ද්විතියික මට්ටමේ තනතුරු 03 ක අතිරික්තයක් විය. | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීම හා පුරප්පාඩු සම්පූර්ණ කරවා ගත යුතුවේ. | දැනට සම්පූර්ණ කාර්ය මණ්ඩලය සමාලෝචනය කර සභාවට අවශ්‍ය කාර්ය මණ්ඩලය ලබා ගැනීම පිණිස පළාත් පාලන දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කරමින් සිටිමි. |
| (ආ) සමාලෝචිත වර්ෂය අවසානයට මියගිය , විශ්‍රාම ගිය , සේවය හැර ගිය හා ස්ථාන මාරු වී ගිය සේවකයින් 07 දෙනෙකුගෙන් අයවිය යුතු රු.133,123 ක ණය ශේෂය අයකර ගෙන නොතිබුණි. | හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගත යුතුවේ. | ණය ශේෂ අයවිය යුතු හත් දෙනාගෙන් පස් දෙනෙකු ස්ථාන මාරු වී ගිය නිලධාරින් වන අතර ඔවුන් ස්ථාන මාරු වී ගිය ආයතන වෙත එකී ශේෂ නිරවුල් කරන ලෙස දන්වා ඇති අතර ඉතිරි දෙදෙනා විශ්‍රාමිකයින් වන අතර ඔවුන් ගේ මෙම මුදල් අයකර ගැනීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට දන්වා ඇත. |

3.4 ප්‍රසම්පාදනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තාක්ෂණික ඇගයුම් කමිටු පත් නොකිරිම<br>------------------------------<br>සමාලෝචිත වර්ෂය සඳහා තාක්ෂණික ඇගයුම් කමිටු පත්කර නොතිබූ අතර මුදල් කමිටු තිරණය පරිදි මිළදී ගැනීම් සිදු කර තිබුණි. | මිළදී ගැනීම් සිදු කිරිමේදී ඊට අදාල තාක්ෂණික ඇගයුම් කමිටු නිර්දේශය ලබාගත යුතුවේ. | ඉදිරියේදි තාක්ෂණික ඇගයුම් කමිටු පත් කරමි. |

4. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

4.1 අයවැය ගත පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වැය විෂයයන් 21 කට අදාලව අයවැයගත ප්‍රතිපාදනය සියයට සියයක් ඉතිරි වී තිබුණි. | වාර්ෂික අයවැය ලේඛනය තාත්විකව පිළියෙල කල යුතු වේ. | වෙන් කර ඇති වැය විෂයයන්ට වඩා ප්‍රමුඛතාවය දියයුතු වැය විෂයයන් හඳුනාගත් බැවින් එකී වැඩ සටහන් ක්‍රියාත්මක කිරිම සඳහා ප්‍රතිපාදන මාරු කරන ලදි. |

4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත් කර තිබුණ ද එකී නිලධාරියෙකු වෙත වෙනත් රාජකාරිද පවරා තිබු අතර අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කර ඒ අනුව අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කර ඒ අනුව විගණනය කල යුතු වේ. | මේ වන විට අභ්‍යන්තර විගණන විෂය සඳහා වෙනත් රාජකාරිවලින් බැහැර වූ නිලධාරියෙකු පත්කර ඇති අතර අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කර ඒ අනුව කටයුතු කිරිමට දැනුම් දෙමි. |

4.3 නොවිසඳී ඇති විගණන නිරීක්‍ෂණ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 2.2.1( අ) (ඇ) හා (ඉ) ඡේද නිවැරදි කිරිමට කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදි නිවැරදි කරමි. |